සැ. යු. - (i) 2015.02.27 වැනි දින පළ වූ අංක 1,904 දරන ගැසට් පත්‍රයේ III කොටස පළ නොවීය.

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අංක 1,905 - 2015 මාර්තු මස 06 වැනි සිකුරාදා - 2015.03.06**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

## I වැනි කොටස : (IIආ) වැනි ඡේදය - පළකිරීම්

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත)

| | පිටුව |
|---|---|
| ටෙන්ඩර් කැඳවීමේ දැන්වීම් .... ... ... | 322 |
| තීරණය කළ ටෙන්ඩර් පත් පිළිබඳ දැන්වීම් ... ... ... | — |
| බඩු බාහිරාදිය විකිණීම් ... ... ... | — |
| තොටුපළ් රේන්ද හා වෙනත් රේන්ද විකිණීම් ... ... ... | — |
| රජයේ නොවන දැන්වීම් ... ... ... | 323 |
| රට බීම විකිණීමේ බලපත්‍රය සඳහා වූ අයදුම්පත් ... ... | — |
| වෙන්දේසි කිරීම් පිළිබඳ දැන්වීම් ... ... ... | 327 |

**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

### වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට **තෙමසකට** පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළ කරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2015 මාර්තු මස 27 වැනි දින පළ කෙරෙන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2015 මාර්තු මස 13 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනැවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගණුදෙනු පනත - 9 වැනි වගන්තිය**

*" යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් ගැසට් පත්‍රයේ පළ කළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන ගැසට් පත්‍රයක පළ කරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැලකිය යුතුය."*

**ඩබ්ලිව්. ඒ. ඒ. ජී. ෆොන්සේකා,**
රජයේ මුද්‍රණාලයාධිපති *(වැ. බ.)*.

2015 ජනවාරි මස 22 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

*මෙම ගැසට් පත්‍රය www. documents.gov. lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

321 - B 80925 - 5,302 (2015/03)
2 B 4 –

# ටෙන්ඩර් කැඳවීමේ දැන්වීම්

**ඉඩම් හා ඉඩම් සංවර්ධන අමාත්‍යාංශය**

ශ්‍රී ලංකා මිනින්දෝරු දෙපාර්තමේන්තුව

**මිල ගණන් කැඳවීමයි**

***ප්‍රාදේශීය මිනින්දෝරු කාර්යාල සඳහා ගොඩනැගිලි කුලියට ගැනීම - 2015***

වසර දෙකක කාලයක් සඳහා පහත දැක්වෙන ප්‍රාදේශීය මිනින්දෝරු කාර්යාලය සඳහා ගොඩනැගිල්ලක් කුලියට ගැනීමට මිල ගණන් 2015.03.23 වැනි දින පස්වරු 2.00 දක්වා අදාල පළාත් සර්වේයර් ජනරාල් කාර්යාලයේ දී භාරගනු ලැබේ. එදිනම ප. ව. 2.05 ට මිල ගණන් විවෘත කරනු ලැබේ.

| *පළාත* | *දිස්ත්‍රික්කය* | *ප්‍රාදේශීය මිනින්දෝරු කාර්යාලය* | *මිල ගණන් භාර ගැනීම* | *ආසන්න නගරය* | *නිවස අවශ්‍ය දිනය* |
|---|---|---|---|---|---|
| බස්නාහිර පළාත | කලුතර | මතුගම | පළාත් සර්වේයර් ජනරාල් (බස්නාහිර පළාත)<br>සර්වේයර් ජනරාල් කාර්යාලය,<br>150, කිරුල පාර, නාරාහේන්පිට,<br>කොළඹ 05. | මතුගම | 2015.04.01 |

*සපුරාලිය යුතු පොදු අවශ්‍යතා .-*

සෑම ගොඩනැගිල්ලක්ම ආරක්ෂිත වැටකින් හෝ තාප්පයකින් ආරක්ෂා වී තිබිය යුතුය. ජල නළ පහසුකම් තිබිය යුතු අතර, අප ද්‍රව්‍ය හෝ ජලය ඉවත් කිරීමේ ක්‍රමවත් පද්ධතියක් තිබිය යුතු ය. ජල හා විදුලි මීටර් වෙන වෙන ම තිබිය යුතු ය. යාබදව අධික ශබ්ද නැගෙන කර්මාන්තශාලා හෝ එවැනි වෙනත් දෑ නොතිබිය යුතු ය. ගොඩනැගිල්ල පිහිටා ඇත්තේ ප්‍රධාන මාර්ගයට යාබදව නොවේ නම් ඒ සඳහා ක්‍රමවත් පිවිසුම් මාර්ගයක් තිබිය යුතු ය.

පහත දක්වා ඇති ආකෘතියට අනුව සකසන ලද ඉල්ලුම් පත්‍ර, සපුරාලිය යුතු පොදු අවශ්‍යතා විස්තර ද, සහිතව, ලිපි කවරයේ ඉහල වම් කෙළවරෙහි " ප්‍රාදේශීය මිනින්දෝරු කාර්යාල කුලියට ගැනීම" (ස්ථාන නාමය) යනුවෙන් සඳහන් කර, 2015.03.23 වැනි දින පස්වරු 2.00 ට පෙර ලැබෙන සේ පළාත් සර්වේයර් ජනරාල් කාර්යාලයට ලියාපදිංචි තැපෑලෙන් එවීම හෝ ගෙනැවිත් භාරදීම කළ හැකිය.

සර්වේයර් ජනරාල්.

2015 පෙබරවාරි මස 18 වැනි දින,
කොළඹ 05, කිරුල පාර, සර්වේයර් ජනරාල් කාර්යාලයේ දී ය.

***ප්‍රාදේශීය මිනින්දෝරු කාර්යාල සඳහා ගොඩනැගිලි කුලියට ගැනීම - 2015***

**මිල ගණන් කැඳවීමේ ඉල්ලුම් පත්‍රය - 2015**

ගොඩනැගිලි අයිතිකරුගේ -

1. සම්පූර්ණ නම : ----------------------.
2. ලිපිනය : ----------------------.
3. දුරකථන අංකය : ----------------------.
4. ජාතික හැඳුනුම්පත් අංකය: ----------------------.

ගොඩනැගිල්ල -

1. කුලියට දෙනු ලබන්නේ කුමන ප්‍රාදේශීය මිනින්දෝරු කාර්යාලය සඳහා ද? : ----------------------.
2. මාසික කුලී මුදල : ----------------------.
3. පිහිටි ස්ථානයේ ලිපිනය : ----------------------.

4. අදාළ නගරයේ සිට පිහිටි ස්ථානයට ඇති දුර ප්‍රමාණය කි. මී. : ----------------------.
5. වර්ග අඩි ප්‍රමාණය හා කාමර ගණන : ----------------------.
6. වෙනම කියවිය හැකි ජල මීටර් තිබේ ද? : ----------------------.
7. වෙනම කියවිය හැකි විදුලි මීටර් තිබේ ද? : ----------------------.
8. ආරක්ෂිත මායිම් විස්තර සපයන්න (තාප්පය/කම්බි වැට/...........................) : ----------------------.
9. නවතා තැබීමට හැකි වාහන ගණන : ----------------------.
10. ප්‍රධාන මාර්ගයට පිවිසීමට ගත වන කාලය : ----------------------.
11. මනාව සැකසුණ සනීපාරක්ෂක තත්වය (විස්තර සහිතව) : ----------------------.
12. දුරකථන පහසුකම් තිබේ නම් දුරකථන අංකය : ----------------------.

ඉහත තොරතුරු සත්‍ය බවත් යම් තොරතුරක් අසත්‍ය බව හෙළිවුවහොත් මවිසින් ඉදිරිපත් කරනු ලබන මිල ගණන් සර්වේයර් ජනරාල් ප්‍රතික්ෂේප කරනු ලබන බව මම දන්නා බවත් මෙයින් පිළිගනිමි.

අයදුම්කරුගේ අත්සන.

03-181

# රජයේ නොවන දැන්වීම්

## දැන්වීමයි

2007 අංක 7 දරන පනතේ 9 (1) වගන්තිය යටතේ නිවේදනයයි.

සමාගමේ නම : කේටර් ප්ලෑන් ඩිස්ට්‍රිබියුටර්ස් (ප්‍රයිවට්) ලිමටඩ්
සමාගමේ අංකය : පී වී 103727
ලියාපදිංචි කාර්යාලය : අංක 170 ඒ, ජයසෙවණ වත්ත, පල්ලේකැලේ, කුණ්ඩසාලේ
ලියාපදිංචි කළ දිනය : 2015 පෙබරවාරි 06.

සමාගමේ ලේකම්වරු.

03-03

## දැන්වීමයි

2007 අංක 7 දරන පනතේ 9 (1) වගන්තිය යටතේ නිවේදනයයි.

සමාගමේ නම : රවී කන්ස්ට්‍රක්ෂන් (ප්‍රයිවට්) ලිමටඩ්
සමාගමේ අංකය : පී වී 103484
ලියාපදිංචි කාර්යාලය : දෙහිදූව පාර, අලුත්වල, අම්බලන්ගොඩ
ලියාපදිංචි කළ දිනය : 2015 ජනවාරි 26

සමාගමේ ලේකම්වරු.

03-02

## සංස්ථාගත කිරීමක් පිළිබඳ ප්‍රසිද්ධ නිවේදනය

(සමාගම් පනතේ 9 (1) වගන්තියට අනුගාමීවයි)

සමාගමේ නම : රූට් හර්බ්ස් (ප්‍රයිවට්) ලිමටඩ්
සමාගම් අංකය : පී වී 102954
ලියාපදිංචි ලිපිනය : අංක 327/8බී, බෝපෙත්ත, 1 වැනි පටුමග, ගොතටුව

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

එච්. ටී. පී. බිස්නස් සර්විසස් (ප්‍රයිවට්) ලිමිටඩ්,

අංක 324/1 ඒ,
ගාලු පාර, කොළඹ 03.

03-32

## දැන්වීමයි

2007 අංක 7 දරන සමාගම් පනත ප්‍රකාරව 2015 පෙබරවාරි මස 02 වැනි දින සංස්ථාගත කරන ලද පහත සඳහන් සමාගම් පිළිබඳ දැන්වීම පහත පළ වේ.

සමාගමේ නම : චයිනා හාබර් ඉංජිනියරින් කම්පැනි (ලංකා) ලිමටඩ්
සමාගමේ අංකය : පී බී 5247
ලියාපදිංචි කාර්යාලය : 32 වැනි මහල, නැගෙනහිර කුලුණ, ලෝක වෙළෙඳ මධ්‍යස්ථානය, එච්ලන් චතුරශ්‍රය, කොළඹ 01

ජේසී සහ සමාගම,
සමාගම් ලේකම්වරු.

අංක 9/5, තම්බයියා ඇවනිව්,
කොළඹ 07.

03-35

## ඇටෝර්නි බලපත්‍රය අවලංගු කිරීම

පිළියන්දල, නිවන්තිඩිය, පාසැල් මාවත, අංක 2/3ඒ දරන ස්ථානයේ පදිංචි චමින්ද පුෂ්ප කුමාර අතුළුවගේ වන මා විසින් 2013.12.13 වැනි දින කොට්ටාව හි දී අත්සන් කරන්නට යෙදුනු අංක 2918 දරන ඇටෝර්නි බලපත්‍රය මගින් පිළියන්දල, මකුළුදූව, ශ්‍රී මේධානන්ද මාවත, අංක 56ඒ දරන ස්ථානයේ පදිංචි හෝල්ලුපතිරගේ සිසිර කුමාර කල්දේරා යන අයට පවරන ලද සියලුම ඇටෝර්නි බලතල 2014.12.23 වැනි දින සිට අවලංගු කරනු ලබන බව සියලු දෙනා වෙත ම මෙයින් දන්වා සිටිමි.

චමින්ද පුෂ්ප කුමාර අතුළුවගේ

2014 දෙසැම්බර් මස 23 වැනි දින.

03-38

### දැන්වීමයි

කොළඹ 05, පොල්හේන්ගොඩ පාර, අංක 261/15 හි පදිංචි ගාමිණී ධනංජය කුමා සෙනරත් ගුණසේකර (ජා. හැ. අ. 510963270 V) වන මා විසින් කොළඹ 05, පොල්හේන්ගොඩ පාර අංක 261/15 හි පදිංචි පියසීල පද්මා ගුණසේකර (ජා. හැ. අ. 248270950 V) යන අයට දී තිබූ සැමබියාවේ නැතනියල් ඇලෝෂියස් මොක්සෝන් ප්‍රසිද්ධ නොතාරිස් විසින් සහතික කරන ලද 1979.02.02 වැනි දින දරන විදේශ ඇටර්නි බලපත්‍රය 2015.02.06 පටන් බලරහිත, ප්‍රත්‍යාදිෂ්ට සහ නිෂ්ප්‍රභා කරන බව මෙයින් දැනුම් දෙමි.

03-74

---

### දැන්වීමයි

2007 අංක 7 දරන සමාගම් පනතේ 9 වැනි වගන්තිය යටතේ කරනු ලබන දැන්වීමයි.

සමාගමේ නම : මාස්ටර් මීඩියා වන් (පුද්ගලික) සමාගම
සමාගම් අංකය : P V 102807
ලියාපදිංචි කාර්යාලයේ ලිපිනය : අංක 61, උඩුමුල්ල පාර, බත්තරමුල්ල
සංස්ථාගත කළ දිනය : 2014.12.15

සුප්‍රීම් කන්සල්ටන්සි සර්විසස් (පුද්ගලික) සමාගම,
ලේකම්වරු.

03-80/1

---

### දැන්වීමයි

2007 අංක 7 දරන සමාගම් පනතේ 9 වැනි වගන්තිය යටතේ කරනු ලබන දැන්වීමයි.

සමාගමේ නම : ඔකිනාවා ඉන්ටර්නැෂනල් (පුද්ගලික) සමාගම
සමාග ම් අංකය : P V 103008
ලියාපදිංචි කාර්යාලයේ ලිපිනය : අංක 326/ D 1, වාල්ස්ටන් වත්ත, කිරිදිවිට පාර, ගනේමුල්ල
සංස්ථාගත කළ දිනය : 2014.12.24

සුප්‍රීම් කන්සල්ටන්සි සර්විසස් (පුද්ගලික) සමාගම,
ලේකම්වරු.

03-80/2

---

### දැන්වීමයි

2007 අංක 7 දරන සමාගම් පනතේ 9 වැනි වගන්තිය යටතේ කරනු ලබන දැන්වීමයි.

සමාගමේ නම : සී ඕ පී ජී කේ ඩබ්ලිව් ලින්ක්ස් (පුද්ගලික) සමාගම
සමාග ම් අංකය : P V 103125
ලියාපදිංචි කාර්යාලයේ ලිපිනය : අංක 2/54, ශ්‍රී සුමන මාවත, මුද්දුව, රත්නපුර
සංස්ථාගත කළ දිනය : 2015.01.01

සුප්‍රීම් කන්සල්ටන්සි සර්විසස් (පුද්ගලික) සමාගම,
ලේකම්වරු.

03-80/3

---

### දැන්වීමයි

2007 අංක 7 දරන සමාගම් පනතේ 9 වැනි වගන්තිය යටතේ කරනු ලබන දැන්වීමයි.

සමාගමේ නම : ද ඉවෙන්ට් ප්ලෑනර්ස් කළම්බු (පුද්ගලික) සමාගම
සමාග ම් අංකය : P V 100123
ලියාපදිංචි කාර්යාලයේ ලිපිනය : අංක 20, ප්‍රැන්සස් පාර, කොළඹ 06
සංස්ථාගත කළ දිනය : 2014.08.14

සුප්‍රීම් කන්සල්ටන්සි සර්විසස් (පුද්ගලික) සමාගම,
ලේකම්වරු.

03-80/4

---

### 2007 අංක 7 දරන සමාගම් පනතේ 9 (1) වගන්තිය යටතේ කරනු ලබන දැන්වීමයි

සමාගමේ නම : ස්මාට් ස්නේක් ටෙක්නිකල් සර්විසස් (පීවීටී) එල්ටීඩී
සමාගම් අංකය : පී වී 103789
දිනය : 2015.02.11
ලියාපදිංචි ලිපිනය : අංක 172, උසාවිය පාර, කොළඹ 12
සමාගමේ ලේකම් : සී මැතිව් සහ කො. (පුද්ගලික) සමාගම
එස්. ඊ. සී/(2) 2013/.311

03-115

---

### නිවේදනයයි

2007 අංක 7 දරන සමාගම් පනතේ 9 (1) වගන්තිය ප්‍රකාරව මෙයින් නිවේදනය කෙරේ.

සමාගමේ නම : එම්. ඩබ්ලිව්. ඇන්ඩ් සන්ස් (පීවීටී) එල්ටීඩී
සමාගමේ ලියාපදිංචි අංකය : පීවී 96126
සංස්ථාපනය කළ දිනය : 2013.12.19
ලියාපදිංචි කාර්යාලයේ ලිපිනය : අංක 285/4, මව්න්ටෙම්පල්, ගම්පොල

සමාගමේ ලේකම්.

03-118

---

### 2007 අංක 07 දරන සමාගම් පනතේ අංක 9 (1) වගන්තිය යටතේ කරනු ලබන දැන්වීමයි

සමාගමේ නම : ලංකා ලයිව් මරින් සී ෆුඩ් (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගමේ අංකය : පීවී 102712
ලියාපදිංචි ලිපිනය : අංක 11/3 ඩී, ශ්‍රී ධර්මාරාම පාර, රත්මලාන

සමාගම් ලේකම්.

03-129/1

**2007 අංක 07 දරන සමාගම් පනතේ අංක 9 (1) වගන්තිය යටතේ කරනු ලබන දැන්වීමයි**

සමාගමේ නම : ටොංග්ඩාම් ඉංජිනියරින් කම්පැනි (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගමේ අංකය : පීවී 102786
ලියාපදිංචි ලිපිනය : අංක 11/3 ඩී, ශ්‍රී ධර්මාරාම පාර, රත්මලාන

සමාගම් ලේකම්.

03-129/2

---

**2007 අංක 07 දරන සමාගම් පනතේ අංක 9 (1) වගන්තිය යටතේ කරනු ලබන දැන්වීමයි**

සමාගමේ නම : ජිග්සො එන්සෙම්බල් (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගමේ අංකය : පී වී 103639
ලියාපදිංචි ලිපිනය : අංක 168, ජම්බුගස්මුල්ල මාවත, නුගේගොඩ.

සෙක්‍රටේරියල් (ප්‍රයිවට්) ලිමිටඩ්.
පී. වී. 5958

03-130

---

**අල් ෂාවි ජෙනරල් ට්‍රේඩිං (ප්‍රයිවට්) ලිමිටඩ්**

2007 අංක 7 දරන සමාගම් පනතේ 9 (1) වගන්තිය යටතේ සංස්ථාගත කිරීම පිළිබඳ ප්‍රසිද්ධ දැන්වීම

2015 පෙබරවාරි මස 02 වැනි දින සමාගම් ලියාපදිංචි අංක පී වී 102738 යටතේ "අල් ෂාවි ජෙනරල් ට්‍රේඩිං (ප්‍රයිවට්) ලිමිටඩ්" යන නාමය යටතේ නව සමාගමක් සංස්ථාපනය කරනු ලැබ ඇති බව සහ එහි ලියාපදිංචි කාර්යාලය අංක 28, (2 වැනි මහල) ඩබ්ලිව්. ඒ. ඩී. රාමනායක මාවත, කොළඹ 02 යන ස්ථානයේ බව අපි මෙයින් මහජනතාවට දැනුම් දෙමු.

එම් ඇන්ඩ් ඒ කම්පනි සෙක්‍රටරීස් (ප්‍රයිවට්) ලිමිටඩ්,
සමාගමේ ලේකම්වරු.

අංක 28, (2 වැනි මහල),
ඩබ්ලිව්. ඒ. ඩී. රාමනායක මාවත,
කොළඹ 02.

03-138

---

**සමාගමක් සංස්ථාපිත කළ බවට ප්‍රසිද්ධ කිරීමයි**

2007 අංක 07 දරන සමාගම් පනතේ ප්‍රතිපාදන ප්‍රකාරව ඩැට් මැනේජ්මන්ට් සර්විසස් (ප්‍රයිවට්) ලිමිටඩ් නමැති සමාගම සංස්ථාපනය කරන ලදී.

ලියාපදිංචි අංකය : P V 103676
ලියාපදිංචි කාර්යාලය : අංක 546/3, මිහිඳු මාවත, අතුරුගිරිය පාර, මාලබේ.

03-143

---

**දැන්වීමයි**

2007 අංක 7 දරන සමාගම් පනතේ 9 වැනි වගන්තිය ප්‍රකාරව පහත සඳහන් සමාගම සංස්ථාගත කිරීම පිළිබඳ දැන්වීම අප විසින් මෙලෙස පළ කෙරේ.

සමාගමේ නාමය : ලංකා කල්චර් ඩිවලොප්මන්ට් (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගමේ අංකය : P V 103382
ලියාපදිංචි කාර්යාලයේ ලිපිනය : අංක 47, ඇලෙක්සැන්ඩ්‍රා පෙදෙස, කොළඹ 07
සංස්ථාගත කළ දිනය : 2015 ජනවාරි මස 21 වැනි දින.

කෝපරේට් ඇඩ්වයිසරි සර්විසස් (ප්‍රයිවට්) ලිමිටඩ්,
සමාගම් ලේකම්වරු.

03-147

---

**දැන්වීමයි**

2007 අංක 7 දරන සමාගම් පනතේ 9 වැනි වගන්තිය ප්‍රකාරව පහත සඳහන් සමාගම සංස්ථාගත කිරීම පිළිබඳ දැන්වීම අප විසින් මෙලෙස පළ කෙරේ.

සමාගමේ නාමය : සියඹලා ඇග්‍රෝ (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගමේ අංකය : P V 103509
ලියාපදිංචි කාර්යාලයේ ලිපිනය : අංක 21, කාසල් ඇවනිව්, කොළඹ 08
සංස්ථාගත කළ දිනය : 2015.01.26

කෝපරේට් ඇඩ්වයිසරි සර්විසස් (ප්‍රයිවට්) ලිමිටඩ්,
සමාගම් ලේකම්වරු.

03-148

---

**ප්‍රසිද්ධ දැන්වීමයි**

2007 අංක 7 දරන සමාගම් පනතේ 9(1) වැනි වගන්තිය ප්‍රකාරව සමාගමක් සංස්ථාගත කිරීම පිළිබඳවයි.

සමාගමේ නාමය : ඔවික්ලෝ ලොජිස්ටික්ස් (පීවීටී) එල්ටීඩී
සමාගමේ අංකය : පී වී 103703
ලියාපදිංචි දිනය : 2015 පෙබරවාරි 05
ලිපිනය : අංක 539/3A, නව නුවර පාර, බියගම.

සමාගම් ලේකම්වරු.

03-163

---

**සාටෝ වෙම්ෆා ලංකා (ප්‍රයිවට්) ලිමිටඩ්**

සමාගම් ලියාපදිංචි අංකය : P V 18035

**සාමාජිකයන් ස්වේච්ඡාවෙන් ගණන් බේරා වසා දැමීමේ දැන්වීම**

2015 පෙබරවාරි මස 19 වැනි දින සමාගමේ පැවති විශේෂ මහා සභා රැස්වීමේ දී සිදු කරන ලද විශේෂ යෝජනා සම්මතය මත 2007 අංක 07 දරන සමාගම් පනතේ 319 (1) (බී) වගන්තිය යටතේ මෙම සමාගම 2015 පෙබරවාරි මස 19 වැනි දින සිට සාමාජිකයන් විසින් ස්වේච්ඡාවෙන් ගණන් බේරා වසා දැමීමට තීරණය කරන ලදී.

ඩී. ඩී. ධර්මසිරි,
අධ්‍යක්ෂ.

03-164/1

**සාටෝ චෙමිෆා ලංකා (ප්‍රයිවෙට්) ලිමිටඩ්**

සමාගම් ලියාපදිංචි අංකය : P V 18035

**2007 අංක 7 දරන සමාගම් පනතේ 346 (1) වගන්තිය යටතේ සමාගමේ ඈවරකරු පත්කිරීමේ දැන්වීම**

නුගේගොඩ, පැපිලියාන පාරේ, අංක 22/2 හි පදිංචි කේ. ජී. පී. විජයවර්ධන යන මම අංක 426, හෝකන්දර උතුර, හෝකන්දර දරන ස්ථානයේ පිහිටි සාටෝ චෙමිෆා ලංකා (ප්‍රයිවෙට්) ලිමිටඩ් හි ඈවරකරු වශයෙන් 2015 පෙබරවාරි මස 19 වැනි දින පැවති විශේෂ මහා සභා රැස්වීමේ දී සාමාන්‍ය යෝජනා සම්මතයෙන් පත් කරන ලද බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

කේ. ජී. පී. විජයවර්ධන,
ඈවරකරු.

03-164/2

---

**සීමාසහිත යුනටඩ් ඩෙන්ඩ්‍රො බලශක්ති (පුද්ගලික) සමාගම**
(P V 16903)

ණය හිමියන් විසින් ස්වේච්ඡාවෙන් ඈවර කිරීම

**ණය හිමියන්ගේ අවසාන රැස්වීම පිළිබඳ දැනුම්දීම**

2007 අංක 7 දරන සමාගම් පනතේ 341 (2) වගන්තියට අනුකූලව මෙමගින් දැනුම්දෙන පරිදි ඉහත නම් සඳහන් සමාගමේ ණය හිමියන්ගේ අවසාන රැස්වීම 2015 අප්‍රේල් මස 06 වැනිදා පෙ. ව. 10.30 ට අංක 100/1 ශ්‍රී ජයවර්ධනපුර මාවත, රාජගිරිය යන ස්ථානයේ දී පහත අරමුණ උදෙසා පැවැත්වේ.

නිමාවට පත්කිරීමේ ක්‍රියාවලිය සහ එම කාලය තුළ ක්‍රියාකාරකම්, ගිණුම් සහ ගනුදෙනු පිළිබඳව කරුණු ඉදිරිපත් කිරීම

කේ. ඒ. කේ. පී. ගුණවර්ධන,
නීතිඥ,
අදව්කරු.

2015 පෙබරවාරි 20,
අංක 100/1 ශ්‍රී ජයවර්ධනපුර මාවත,
රාජගිරිය.
03-168

---

**සීමාසහිත යුනටඩ් ඩෙන්ඩ්‍රො බලශක්ති (පුද්ගලික) සමාගම**
(P V 16903)

ණය හිමියන් විසින් ස්වේච්ඡාවෙන් ඈවර කිරීම

ණය හිමියන්ගේ අවසාන රැස්වීම පිළිබඳ දැනුම්දීම

2007 අංක 7 දරන සමාගම් පනතේ 341 (2) වගන්තියට අනුකූලව මෙමගින් දැනුම්දෙන පරිදි ඉහත නම් සඳහන් සමාගමේ සාමාජිකයන්ගේ අවසාන රැස්වීම 2015 අප්‍රේල් මස 06 වැනිදා පෙ. ව. 10.00 ට අංක 100/1 ශ්‍රී ජයවර්ධනපුර මාවත, රාජගිරිය යන ස්ථානයේ දී පහත අරමුණ උදෙසා පැවැත්වේ.

නිමාවට පත්කිරීමේ ක්‍රියාවලිය සහ එම කාලය තුළ ක්‍රියාකාරකම්, ගිණුම් සහ ගනුදෙනු පිළිබඳව කරුණු ඉදිරිපත් කිරීම

කේ. ඒ. කේ. පී. ගුණවර්ධන,
නීතිඥ,
අදව්කරු.

2015 පෙබරවාරි 20,
අංක 100/1 ශ්‍රී ජයවර්ධනපුර මාවත,
රාජගිරිය.
03-169

---

**ඇටෝර්නි බලය අවලංගු කිරීම**

දොඩන්ගොඩගේ දොන් ජගත් ප්‍රසන්න වික්‍රමරත්න විසින් දොඩන්ගොඩගේ දෝන ශ්‍රීමති ස්වර්ණලතා වික්‍රමරත්න යන අයට දුන් කඩුවෙල ප්‍රසිද්ධ නොතාරිස් එච්. එන්. වෙත්තසිංහ විසින් සහතික කළ අංක 12815 දරන ඇටෝර්නි බලපත්‍රය 2015.01.28 වැනි දින සිට අවලංගු කෙරේ.

03-175

---

**දැන්වීමයි**

2007 අංක 7 දරන සමාගම් පනතේ 9 (1) දරන ඡේදය යටතේ -

සමාගමේ නම : ඉකෝ එනර්ජි සිස්ටම්ස් ලංකා (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගමේ අංකය : P V 103536
සංස්ථාගත කළ දිනය : 2015.01.27
ලියාපදිංචි ලිපිනය : අංක 160/1/1, නාවල පාර, නුගේගොඩ.

ලේකම්වරු.

03-189/1

---

**දැන්වීමයි**

2007 අංක 7 දරන සමාගම් පනතේ 9 (1) දරන ඡේදය යටතේ -

සමාගමේ නම : කැන්ඩි ඔටෝ සර්විස් ඉන්ටර්නැෂනල් (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගමේ අංකය : P V 103544
සංස්ථාගත කළ දිනය : 2015.01.27
ලියාපදිංචි ලිපිනය : අංක 03, දුම්රිය පාර, කටුගස්තොට.

ලේකම්වරු.

03-189/2

---

**ප්‍රසිද්ධ නිවේදනයයි**

රේවන්ස් අයි (පීවීටී) එල්. ටී. ඩී. 2007 අංක 07 දරන සමාගම් පනතේ 09 වැනි වගන්තිය ප්‍රකාරව 2014 දෙසැම්බර් මස 19 වැනි දින සංස්ථාපනය කරන ලද බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

සමාගමේ නම : රේවන්ස් අයි (පී වී ටී) එල්. ටී. ඩී.
සමාගමේ අංකය : පී වී 102945
ලියාපදිංචි කාර්යාලය : 29A, සුදස්සන පාර, ඉසදීන් නගරය, මාතර.

අධ්‍යක්ෂකවරුන්ගේ අණ පරිදි,

සමාගම් ලේකම්.

03-206

### දැන්වීමයි

2007 අංක 7 දරන සමාගම් පනතේ 9 වන වගන්තිය ප්‍රකාරව පහත සඳහන් සමාගම සංස්ථාගත කිරීම පිළිබඳ දැන්වීම අප විසින් මෙලෙස පළ කෙරේ.

සමාගමේ නාමය : ජොබ්සි (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගමේ අංකය : PV 102949
ලියාපදිංචි කාර්යාලයේ ලිපිනය : අංක 143/1, ගල්වල පාර, දෙහිවල
සංස්ථාගත කළ දිනය : 2014.12.19

සමාගම් ලේකම්වරු.

03-208

---

### ඇටෝර්නි බලය අවලංගු කිරීම

යාපනය, කන්කසන්තුරේ පාර, අංක 976 දරන ස්ථානයේ පදිංචි දේවා සතිශ්කුමාර් වන මා විසින් ප්‍රසිද්ධ නොතාරිස් එස්. ඉලංගෝවන් මහත්මිය විසින් සහතික කරන ලද අංක 8287 හා 2012 දෙසැම්බර් මස 27 දාතම දරන ඇටෝර්නි බලපත්‍රය මගින් චුල්ලිපුරම්, තෝල්පුරම් නැගෙනහිර පදිංචි සිවකුමාරි මුරුගේසු මහත්මිය වෙත පවරන ලද ඇටෝර්නි බලය අවලංගු කොට එම ඇටෝර්නි බලපත්‍රය බල රහිත කරන බවත්, මින් ඉදිරියට ඇය විසින් මා වෙනුවෙන් කරනු ලබන කිසිම ගනුදෙනුවකට අද සිට එනම් වර්ෂ 2015ක් වූ ජනවාරි මස 05 වැනි දින සිට මා වග නොකියන බවත් ශ්‍රී ලංකා ජනරජයටත් මහජනතාවටත් දන්වා සිටිමි.

දේවා සතිශ්කුමාර්.

03-209

### දැන්වීමයි

2007 අංක 7 දරන සමාගම් පනතේ 9 වන වගන්තියෙහි විධිවිධාන යටතේ පහත සඳහන් සමාගම සීමාසහිත සමාගමක් ලෙස සංස්ථාගත කරන ලදී.

සමාගම් නාමය : පී එස් සී ලංකා ඉන්ටර්නැෂනල් (පීවීටී) එල්ටීඩී
ලියාපදිංචි අංකය : P V 103841
ලියාපදිංචි කාර්යාලයේ ලිපිනය : අංක 300/94, වෙස්ට් වුඩ් පාර්ක්, වෛද්‍ය සී වී කොරෙයා ඇවනියු හෝකන්දර දකුණ, හෝකන්දර.
සංස්ථාගත කළ දිනය : 2015.02.12

සමාගම් ලේකම්.

03-212

---

### විශේෂ ඇටෝර්නි බලපත්‍රය අවලංගු කිරීම

වයඹ පළාතේ, පුත්තලම් දිස්ත්‍රික්කයේ, ගල්මුරුව තැපල් වසමේ, හෙලේනාවත්ත, කුඩිරිප්පුව පදිංචි, සූරිය ආරච්චිගේ දෝන පිලිමින් දිල්හානි (ජා. හැ. අං. 877021998 V හිමි) වන මම, මා විසින් මාගේ විශේෂ ඇටෝර්නි බලකරු වශයෙන් ඉහත කී දිස්ත්‍රික්කයේ, පනිරෙන්ඩාව තැපැල් වසමේ නාන්කඩවර, දිවිරුම්වත්ත හි පදිංචි, ජයසිංහ අප්පුහාමිලාගේ චමින්ද ජයසිංහ යන අයව පත් කරන ලද දුම්මලසූරිය, නීතිඥ සහ ප්‍රසිද්ධ නොතාරිස් ජේ. ඒ. නිහාල් ජයසිංහ මහතා විසින් 2013ක් වූ ජනවාරි මස 04 වැනි දින ලියා සහතික කළ අංක 5596 දරන විශේෂ ඇටෝර්නි බලපත්‍රය වර්ෂ 2015ක් වූ පෙබරවාරි මස 23 වැනි දින සිට අවලංගු කරනු ලබන බව ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයට ද, එහි ජනතාවට ද මෙයින් දන්වා සිටිමි. එසේ ම එකී විශේෂ ඇටෝර්නි බලපත්‍රය යටතේ ජයසිංහ අප්පුහාමිලාගේ චමින්ද ජයසිංහ යන අය විසින් කරනු ලබන කිසිදු ක්‍රියාවකට 2015.02.23 වැනි දින සිට මා වග නොකියන බව ද මෙයින් ප්‍රකාශ කර සිටිමි.

සූරිය ආරච්චිගේ දෝන පිලමින් දිල්හානි.

03-215

---

# වෙන්දේසි කිරීම් පිළිබඳ දැන්වීම්

### මහජන බැංකුව - ලකී ප්ලාසා ශාඛාව

**1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29 ඈ වගන්තිය යටතේ වූ යෝජනා සම්මතය සම්බන්ධව විකුණුම් දැන්වීම**

මහජන බැංකුව විසින් මා වෙත පවරන ලද බලය යටතේ 2015.03.28 වැනි දින පෙ. ව. 11.30ට මෙහි පහත විස්තර වන දේපළ එකී දේපළ පිහිටි ස්ථානයේ දී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

#### උකස් කර ඇති දේපළ පිළිබඳ විස්තරය

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, සියනෑ කෝරලේ, අධිකාරි පත්තුවේ තල්වත්ත පිහිටා ඇත්තාවූ ද "අට්ටික්කාගහවත්ත" කැටකැල්ලගහවත්ත "මාදින්නාවත්ත" සහ "ජම්බුගහවත්ත" යනුවෙන් හැඳින්වෙන ඉඩම් සඳහා බලයලත් මිනින්දෝරු ඩබ්. ජී. සුනිල් සෝමසිරි විසින් සාදන ලද 2011.03.13 වැනි දින අංක 886 දරන පිඹුරේ නිශ්චිතව දක්වා ඇති "ලොට් 1" යනුවෙන් ලකුණු කර ඇත්තාවූ ද, උතුරට : බියගම මාර්ගය ද, නැගෙනහිරට පී. කරුණාරත්න සහ එස්. පෙරේරා යන අය විසින් භුක්ති විඳිනු ලබන ඉඩම ද, දකුණට : මාර්ගය ද, බටහිරට : මාර්ගය ද යන මායිම් තුළ පිහිටා ඇත්තාවූ ද කොළඹ ඉඩම් රෙජිස්ට්‍රාර් කාර්යාලයේ C 762/114 යටතේ ලියාපදිංචි වී ඇති එකී අංක 886 දරන පිඹුරට අනුව ප්‍රමාණයෙන් පර්චස් දාසයයි දශම නවයයි එකක් වූ (අ. 0 රූ. 0 පර්. 16.91) එකී ලොට් අංක 1 දරන බෙදා වෙන් කළ ඉඩම හා ඒ තුළ වූ ගොඩනැගිලි සහ වෙනත් සියලු දේ ද වේ.

වැඩි විස්තර සඳහා 2013.09.20 දිනැති රජයේ *ගැසට් පත්‍රයේ* ද, 2013 සැප්තැම්බර් මස 24 වැනි දින දිනමිණ සහ ඩේලිනිව්ස් පුවත්පත්වල පළකර ඇති වෙන්දේසි යෝජනා දැන්වීමට අවධානය යොමු කරන්න.

*දේපළට පිවිසීම.-* කොළඹ නුවර පාරේ කි. මී. 6.4ක් පමණ ගියවිට 4 කණුව හන්දියෙන් දකුණු පසට ඇති බියගම පාරේ කි. මී. 6.5ක් පමණ

ගියවිට තල්වත්ත හන්දිය හමුවේ. එම හන්දිය පසුකර මීටර් 100ක් පමණ ගියවිට පාරේ දකුණු පස අදාළ දේපළ පිහිටා ඇත.

*ගෙවීමේ ක්‍රමය.* - සාර්ථක ගැණුම්කරු විසින් මිටිය පහත හෙලා වෙන්දේසිය අවසන් වූ වහාම පහත සඳහන් පරිදි මුදලින් ගෙවීම් කල යුතු ය.

1. ගැණුම් මිලෙන් 10%ක් ද,
2. පළාත් අධිකාරියට ගෙවිය යුතු 1% ක් වන පළාත් අධිකාරි බද්ද,
3. වෙන්දේසිකරුගේ කොමිස් වශයෙන් විකුණුම් මිලෙන් 2 1/2%ක්,
4. ලිපිකරුගේ හා සෝෂක ගාස්තු වශයෙන් රු. 1,000ක් ද,
5. විකුණුම් වියදම සමග වෙනත් ගාස්තු වෙතොත් එම මුදල,
6. විකුණුම් සහතිකය සඳහා මුද්දර ගාස්තු.

ගැණුම් මිලෙන් ඉතිරි 90% ක් වූ මුදල විකුණුම් දින සිට දින 30ක් ඇතුළත මහජන බැංකුව, සහකාර ප්‍රාදේශීය කළමනාකරු (කොළඹ දකුණ) ප්‍රාදේශීය ප්‍රධාන කාර්යාලය (බටහිර 01) අංක 11, ආදිපාද වීදිය, කොළඹ 01, වෙත ගෙවිය යුතු ය.

දුරකථන අංක : 2344982, 2393678 ෆැක්ස් අංකය : 4717009

හිමිකම් ඔප්පු සහ වෙනත් අදාල විස්තර ඉහත ලිපිනයෙන් ලබාගත හැක. ඉහත සඳහන් කරන ලද පරිදි සඳහන් කළ මුදල් දින 30ක් ඇතුළත නොගෙවුවහොත් ගෙවා ඇති ගැණුම් මුදලින් 10% ක මුදල ආපසු නොගෙවීමට සහ නැවත දේපළ විකිණීමට බැංකුවට අයිතිය ඇත.

අර්වින් පෙරේරා,
(සාම විනිසුරු), වෙන්දේසිකරු හා
තක්සේරුකරු උසාවි කොමසාරිස් හා
දිවුරුම්ලත් භාෂා පරිවර්තක.

අංක 03, පාගොඩ පාර,
නුගේගොඩ.
දුරකථන අංක : 2810145, 0718021206.

03-171

---

## කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී. එල්. සී. - විදේශීය ශාඛාව

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වන වගන්තිය යටතේ කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී. එල්. සී (ලියාපදිංචි අංක පී කිව් 116) මගින් මා වෙත පවරා ඇති බලය ප්‍රකාර ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

### ඉහත සඳහන් කළ උපලේඛනය

1. බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ සල්පිටි කෝරළේ පල්ලේ පත්තුවේ කොළඹ නගර සභා සීමාව තුළ පාලන වන අලුත්මාවතේ වසම් අංක 4 අලුත්ගම පාරේ හි පිහිටි අලුත්මාවත පාරේ වරිපනම් අංක 560 දරන ඉඩමට බලයලත් මිනින්දෝරු කේ. සෙල්වරත්නම් විසින් 2001 ජනවාරි මස 9 වැනි දින සාදන ලද අංක 9319 දරන පිඹුරේ ලොට් 1 දරන

ප්‍රමාණය පර්චස් දහයයි දශම නමයයි පහක (අ. 0 රූ. 0පර්. 10.95)
විශාලත්වයෙන් යුත් ඉඩම සහ එහි පිහිටි සියලු දේත් සමග වේ.

2. බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, සල්පිටි කෝරළේ පල්ලේ පත්තුවේ කොළඹ නගර සභා සීමාව තුළ පාලන වන අලුත්මාවතේ වසම් අංක 4 හි පිහිටි අලුත්මාවත පාරේ වරිපනම් අංක 560 (කොටසක්) දරන ඉඩමට බලයලත් මිනින්දෝරු කේ. සෙල්වරත්නම් විසින් 2001 ජනවාරි මස 09 වැනි දින සාදන ලද අංක 9319 දරන පිඹුරේ ලොට් 2 දරන,

ප්‍රමාණය පර්චස් හයක (අ. 0 රූ. 0 පර්. 6)
විශාලත්වයෙන් යුත් ඉඩම සහ එහි පිහිටි සියලු දේත් සමඟ වේ.

3. බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ සල්පිටි කෝරළේ පල්ලේ පත්තුවේ කොළඹ නගර සභා සීමාව තුළ පාලන වන අලුත්මාවතේ වසම් අංක 4 හි පිහිටි අලුත්මාවත පාරේ වරිපනම් අංක 560 දරන ඉඩමට බලයලත් මිනින්දෝරු කේ. සෙල්වරත්නම් විසින් 2001 ජනවාරි 9 වැනි දින සාදන ලද අංක 9319 දරන පිඹුරේ ලොට් 3 දරන,

ප්‍රමාණය පර්චස් දොළහක (අ. 0 රූ. 0 පර්. 12)
විශාලත්වයෙන් යුත් ඉඩම සහ එහි පිහිටි සියලු දේත් සමඟ වේ.

4. බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, සල්පිටි කෝරළේ පල්ලේ පත්තුවේ කොළඹ නගර සභා සීමාව තුළ පාලන වන අලුත්මාවතේ වසම් අංක 4 හි පිහිටි අලුත්මාවත පාරේ වරිපනම් අංක 560 (කොටසක්) දරන ඉඩමට බලයලත් මිනින්දෝරු කේ. සෙල්වරත්නම් විසින් 2001 ජනවාරි මස 09 වැනි දින සාදන ලද අංක 9319 දරන පිඹුරේ ලොට් 4 (පාරක් සඳහා වෙන් කරන ලද)

ප්‍රමාණය පර්චස් හතරයි දශම බිංදුවයි පහක (අ. 0 රූ. 0 පර්. 4.05)
මාර්ග අයිතිය සමග වේ.

රුෆීනා එක්ස්පෝට්ස් යන නමින් හවුල් ව්‍යාපාරයක් පවත්වාගෙන යනු ලබන මාටින් රොබට් ප්‍රනාන්දු සහ එලීස් සින්තියා ප්‍රනාන්දු යන අයවලුන් ණයකරුවන් වශයෙන් කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී. එල්. සී ට උකස් කරන ලද ඉහත සඳහන් කළ දේපළ

වර්ෂ 2015ක් වූ මාර්තු මස 27 වැනි දින පෙ. ව. 11.00 ට ඉහත ස්ථානයේ දී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

යෝජනා සම්මුතිය සඳහා 2014.12.19 වැනි දින *රජයේ ගැසට් පත්‍රය* ද, 2014.12.23 වැනි දින ලක්බිම, ද අයිලන්ඩ් සහ වීරකේසරී පුවත්පත් ද බලන්න. විකිණීම පිළිබඳ දැන්වීම සඳහා 2015.03.06 වැනි දින *රජයේ ගැසට් පත්‍රය* ද, 2015.03.06 වැනි දින ලක්බිම, ද අයිලන්ඩ් සහ වීරකේසරී පුවත්පත් ද බලන්න.

*ඉඩමට පිවිසීම.* - කොළඹ කොටුවේ සිට ජනාධිපති මාවත, සර් බාරොන් ජයතිලක මාවත, මහා වීදිය හරහා යන විට කාන් ඔරලෝසු කණුව ස්මාරකය සහ උතුරු දිශාවට යන විට එන්. එච්. එම්. අබ්දුල් කාදර් පාර, මුහුදු වෙරළ පාර, ශාන්ත ඇන්තනීස් මාවත, ශ්‍රීමත් රාමනාදන් මාවතේ ගියවිට නෞකාගාර හංදිය හමුවේ. එතැනින් අලුත් මාවත පාර හමුවේ. එම පාරේ මීටර් 700ක් පමණ ගිය විට අදාළ දේපළ දකුණු අත පැත්තේ පිහිටා ඇත. එයට විරුද්ධ පසින් සැමට සරණ නමින් ආගමික සංවිධානයක් පිහිටා ඇත.

*ගෙවීමේ ක්‍රමය.* - විකිණීම ස්ථිර කළ වහාම ගැණුම්කරු විසින් පහත සඳහන් ගෙවීම් වෙන්දේසිකරු වෙත මුදලින් ගෙවිය යුතු ය.

(01) ගැණුම් මිලෙන් සියයට දහයක් (10%), (02) පළාත් සභා අයබදු සඳහා සියයට එකයි (1%), (03) වෙන්දේසිකරුගේ කොමිස් මුදල් විකුණුම් මිලෙන් සියයට දෙකයි දශම පහයි (2.5%), (04) නොතාරිස් ගාස්තු රු. 2,000, (5) ලිපිකරු හා සෝෂක වේතනය රු. 500, (06) වෙන්දේසිය සඳහා වැය කරන ලද සියලුම ප්‍රචාරක වියදම්, (07) ගැණුම්කරු විසින් එකතු කල වටිනාකම් බද්ද (VAT) ගෙවිය යුතු යි, (08) ගැණුම් මිලෙන් ඉතිරි සියයට අනුව (90%) විකිණීමේ දින සිට දින 30ක් තුළ දී කොමර්ෂල් බෑන්ක් ඔෆ් සිලෝන් පී. එල්. සී. හි ප්‍රධාන කාර්යාලයේ හෝ විදේශීය ශාඛාවේ තැන්පත් කළ යුතු ය.

හිමිකම් ඔප්පු පරීක්ෂා කිරීම සහ වැඩි විස්තර සඳහා පහත සඳහන් අයගෙන් විමසන්න. -

කළමණාකරු,
කොමර්ෂල් බෑන්ක් ඔෆ් සිලෝන් පී. එල්. සී,
අංක 21, සර් රාසික් ෆරීඩ් මාවත,
කොළඹ 01
දුරකථන අංක : 011 2486778,
ෆැක්ස් අංකය : 011- 2347717.

එල්. බී. සේනානායක,
සාම විනිසුරු, බලයලත් ජ්‍යෙෂ්ඨ වෙන්දේසිකරු,
තක්සේරුකරු, උසාවි කොමසාරිස්.

අංක 182, 3 වැනි මහල උසාවි පාර, කොළඹ 12,
දුරකථන/ෆැක්ස් අංකය : 011- 2445393
ඊමේල් : senaservice@sltnet.lk

03-152

---

**ඩී එෆ් සී සී වර්ධන බැංකුව පී එල් සී**

(කලින් සී/ස ඩී එෆ් සී සී වර්ධන බැංකුව ලෙස හැඳින්වූ)

1990 අංක 04 දරන බැංකු විසින් ප්‍රදානය කරන ලද ණය ආපසු අය කර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතෙහි 8 වන වගන්තිය යටතේ වටිනා දේපළක් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

**අංක 996, 1385 සහ 1471 දරන උකස්කරයන් යටතේ උකස් කරන ලද දේපළ පිළිබඳ විස්තර**

මධ්‍යම පළාතේ, මාතලේ දිස්ත්‍රික්කයේ, දඹුල්ල ලේකම් කොට්ඨාසයේ, වගපනහ පල්ලේසියපත්තු කෝරළේ, දඹුල්ල පාදෙණිය ග්‍රාමයේ පිහිටි අපුල්ලපුවැව වෙළපහළයාය ලෙස හැඳින්වෙන බලයලත් මිනින්දෝරු ඒ. එම්. අනුරරත්න විසින් සාදන ලද 1998 සැප්තැම්බර් මස 21 වැනි දිනැති අංක 189 දරන පිඹුරේ ලොට් අංක 1 - බී ලෙස දැක්වෙන සීමා නිර්ණය කර බෙදා වෙන් කරන ලද බිම් කට්ටිය.

ඉඩමේ ප්‍රමාණය : අක්. 0 රූ. 0 පර්. 16

එහි පිහිටි ගස්වැල්, වගාවන්, ගොඩනැගිලි සහ සියල්ල සහිතව උකස්කරුට සහ ඔහුගේ අමුත්තන් ඉංජිනේරුවන්, කොන්ත්‍රාත්කරුවන්, ගෘහ නිර්මාණ ශිල්පීන්, කුලී කරුවන්, සේවකයන් බදුකරුවන්, බලපත්‍රලාභීන්, ආරාධිතයන් යන අයට සියළුම අවස්ථාවල සහ මින්මතුවට ඔවුන්ගේ කැමැත්ත සහ අවශ්‍යතාවට අනුව, ඕනෑම අරමුණක් සඳහා දිවා කාලයේ හෝ රාත්‍රී කාලයේ යාමට ඒමට පසු කිරීමට අවිදීමින් හෝ වෙනයම් ආකාරයකින් ඔවුන්ගේ අශ්වයන්, ගවයන් හෝ වෙනත් සතුන් මගින් හෝ මෝටර් කාර් රථ, ලොරි රථ මගින් හෝ වෙනත් වාහනයක් මගින් බර පැටවූ හෝ බර නොපටවා පාර දිගේ හෝ පාර මතින් මෙහි විශේෂයෙන් විස්තර කර ඇති සහ එක් ආකාරයක හෝ සියලුම ආකාරයේ අයතීන්, දිශාවන් වාසින් සහ අනුබැදි දේපළ හෝ සාමාන්‍ය පරිභෝජනයේ දී භාවිතා වන සතු කරගන්නා සියළුම අයිතීන් සඳහා සම්පූර්ණ සහ නිදහස් අයිතියක් ඇති අතර ඉහත පිඹුරේ මාර්ගය සඳහා වෙන්කිරීමේ විදුලි කේබල් ඇදීමට ඉහලින් යන වයර් ඇදීමට ජලාපවහන සහ ගෑස් හෝ නළ ජලය සඳහා අදාළ කොටස් සවිකිරීමට සහ වෙනත් ඕනෑම ආකාරයක ක්‍රියාවක් හෝ ඒ සඳහා උත්සාහයට සම්පූර්ණ අයිතියක් ඇත.

දඹුල්ල ප්‍රසිද්ධ නොතාරිස් ඩබ්. එන්. කේ. හීන්කෙන්ද විසින් සහතික කරන ලද 2009 ජූනි මස 09 දිනැති අංක 996 දරන 2011 මාර්තු 30 දිනැති අංක 1385 දරන සහ 2011 ජූලි මස 18 දිනැති අංක 1471 දරන උකස්කරයන් ප්‍රකාර, දඹුල්ල කුරුණෑගල හන්දිය අංක 443 යන ස්ථානයේ පදිංචි කඹුරුවල ආරච්චිගේ සුසිල් විසින් ඩී එෆ් සී සී වර්ධන බැංකුව පීඑල්සී (කලින් සී/ස ඩී එෆ් සී සී වර්ධන බැංකුව) ට උකස් කරන ලදුව, ගෙවීම්වල දී පොරොන්දු නිසියාකාරව ඉෂ්ට නොකරන ලද දේපළ.

ඩී එෆ් සී සී වර්ධන බැංකුව පීඑල්සී විසින් අප වෙත පවරන ලද බලය යටතේ අප විසින් 2015 මාර්තු මස 26 වැනි දින (බ්‍රහස්පතින්දා) ප. ව. 12.30 ට පිහිටි ස්ථානයේදී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

*ගෙවීමේ ක්‍රමය.* - මිළ තින්දු වූ වහාම සාර්ථක ගැණුම්කරු විසින් පහත සඳහන් මුළු මුදල් මුදලින් ගෙවිය යුතු ය.

1. ගැණුම් මිලෙන් 10%ක් (සියයට දහයක්),
2. පළාත් අධිකාරියට ගෙවිය යුතු 1% ක (සියයට එකක) විකුණුම් බදු,
3. වෙන්දේසිකරුගේ කොමිස් මුදල ගැණුම් මිලෙන් 2 1/2% (සියයට දෙකහමාර),
4. රු. 75,000 ක් වන සම්පූර්ණ ප්‍රචාරක පිරිවැය,
5. ලිපිකරුගේ හා සෝෂකගේ ගාස්තුව රු. 500,
6. විකුණුම් කොන්දේසි සඳහා නොතාරිස් ගාස්තුව රු. 2,000.

ගැණුම් මිලෙන් 90% ක් වූ ඉතිරිය ද ශ්‍රී ලංකා ආණ්ඩුව විසින් හෝ වෙනත් අධිකාරියක් විසින් හෝ පණවනු ලබන වෙනත් ව්‍යවස්ථාපිත බදු, තීරු බදු, අය බදු හෝ ගාස්තු අය කිරීම් ද වෙතොත් ඒවා ද සමග වෙන්දේසි දින සිට දින 30 ක් ඇතුළත ගෙවිය යුතු වේ.

වැඩි විස්තර සඳහා කරුණාකර ඩී එෆ් සී සී වර්ධන බැංකුව පීඑල්සී නීති දෙපාර්තමේන්තුව අමතන්න. දුරකථන අංක 011- 2442442.

"ඉහත වෙන්දේසිය පෙර දැනුම්දීමකින් තොරව නවතා ගැනීමේ/අවලංගු කිරීමේ පූර්ණ අයිතිය බැංකුව සතු ය".

ෂොක්මන් සහ සමරවික්‍රම,
එකම රටක් එකම වෙන්දේසිකරුවෙක්,
වසර 123 ක සේවා විශිෂ්ඨත්වය සමගින්.

*ප්‍රධාන කාර්යාලය :*
අංක 24, ටොරින්ටන් පාර,
මහනුවර.
දුරකථන අංකය : 081 - 2227593
දුරකථන/ෆැක්ස් අංකය : 081-2224371
ඊමේල් : schokmankandy@sltnet.lk

*නගර කාර්යාලය හා ප්‍රදර්ශනාගාරය :*
අංක 290, හැව්ලොක් පාර,
කොළඹ 05.
දුරකථන අංක : 011-2502680, 2585408
දුරකථන/ෆැක්ස් අංකය : 011- 2588176
ඊමේල් : schokman@samera1892.com

වෙබ් අඩවිය : www.sandslanka.com

03-126

**ඩීඑෆ්සීසී වර්ධන බැංකුව පී එල් සී**
(කලින් සී/ස ඩීඑෆ්සීසී වර්ධන බැංකුව ලෙස හැඳින්වූ)

1990 අංක 04 දරන බැංකු විසින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතෙහි 8 වැනි වගන්තිය යටතේ වටිනා දේපළක් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

**අංක 1076 දරන උකස්කරය යටතේ උකස් කරන ලද දේපළ පිළිබඳ විස්තර**

මධ්‍යම පළාතේ, මාතලේ දිස්ත්‍රික්කයේ, උතුරු මාතලේ, දඹුල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, වගපනහ පල්ලේසියපත්තුවේ, දඹුල්ල පාදෙණිය ග්‍රාමයේ පිහිටි මිනින්දෝරු ජේ. ටී. ගලගෙදර විසින් සාදන ලද අංක 1871/ඒ2 දරන පිඹුරේ ලොට් අංක 1 ලෙස දැක්වෙන සීමා නිර්ණය කර බෙදා වෙන් කරන ලද බිම් කට්ටිය. ඉඩමේ ප්‍රමාණය : අක්. 0 රූ. 0 පර්. 33.96 එහි පිහිටි වගාවන් සහ සියල්ල සහිතව

2008 සැප්තැම්බර් මස 08 වැනි දිනැති අංක ඩී260/37, 253, 266 දරන ඔප්පුව මගින් සාධාරණව අයිතිව තිබූ දේපළ දඹුල්ල ප්‍රසිද්ධ නොතාරිස් ඩබ්. එන්. කේ. හීන්කෙන්ද විසින් සහතික කරන ලද 2009 නොවැම්බර් මස 30 දිනැති අංක 1076 දරන උකස්කරය ප්‍රකාර, දඹුල්ල කුරුණෑගල හන්දිය, අංක 443 යන ස්ථානයේ පදිංචි කඹුරුවල ආරච්චිගේ සුසිල් විසින් ඩී එෆ් සී සී වර්ධන බැංකුව පීඑල්සී (කලින් සී/ස ඩී එෆ් සී සී වර්ධන බැංකුව) ට උකස් කරන ලදුව, ගෙවීම්වල දී පොරොන්දු නිසියාකාරව ඉෂ්ට නොකරන ලද දේපළ, ඩී එෆ් සී සී වර්ධන බැංකුව පීඑල්සී විසින් අප වෙත පවරන ලද බලය යටතේ අප විසින් 2015 මාර්තු මස 26 වැනි දින (බ්‍රහස්පතින්දා) මධ්‍යාහන 12.00 ට පිහිටි ස්ථානයේ දී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

*ගෙවීමේ ක්‍රමය.* - මිළ තින්දු වූ වහාම සාර්ථක ගැණුම්කරු විසින් පහත සඳහන් මුළු මුදල් මුදලින් ගෙවිය යුතු ය,

1. ගැණුම් මිලෙන් 10%ක් (සියයට දහයක්),
2. පළාත් අධිකාරියට ගෙවිය යුතු 1% ක (සියයට එකක) විකුණුම් බදු,
3. වෙන්දේසිකරුගේ කොමිස් මුදල ගැණුම් මිලෙන් 2 1/2% (සියයට දෙකහමාර),
4. රු. 75,000 ක් වන සම්පූර්ණ ප්‍රචාරක පිරිවැය,
5. ලිපිකරුගේ හා සෝෂකගේ ගාස්තුව රු. 500,
6. විකුණුම් කොන්දේසි සඳහා නොතාරිස් ගාස්තුව රු. 2,000.

ගැණුම් මිලෙන් 90% ක් වූ ඉතිරිය ද ශ්‍රී ලංකා ආණ්ඩුව විසින් හෝ වෙනත් අධිකාරියක් විසින් හෝ පනවනු ලබන වෙනත් ව්‍යවස්ථාපිත බදු, තීරු බදු, අය බදු හෝ ගාස්තු අය කිරීම් ද වෙතොත් ඒවා ද සමග වෙන්දේසි දින සිට දින 30 ක් ඇතුළත ගෙවිය යුතු වේ.

වැඩි විස්තර සඳහා කරුණාකර ඩී එෆ් සී සී වර්ධන බැංකුව පීඑල්සී නීති දෙපාර්තමේන්තුව අමතන්න. දුරකථන අංක 011- 2442442.

"ඉහත වෙන්දේසිය පෙර දැනුම්දීමකින් තොරව නවතා ගැනීමේ/අවලංගු කිරීමේ පූර්ණ අයිතිය බැංකුව සතු ය".

ශොක්මන් සහ සමරවික්‍රම,
වෙන්දේසිකරුවෝ.

*ප්‍රධාන කාර්යාලය :*
අංක 24, ටොරින්ටන් පාර,
මහනුවර.
දුරකථන අංකය : 081 - 2227593
දුරකථන/ෆැක්ස් අංකය : 081-2224371
ඊමේල් : schokmankandy@sltnet.lk

*නගර කාර්යාලය හා ප්‍රදර්ශනාගාරය :*
අංක 290, හැව්ලොක් පාර,
කොළඹ 05
දුරකථන අංක : 011-2502680, 2585408
දුරකථන/ෆැක්ස් අංකය : 011- 2588176
ඊමේල් : schokman@samera1892.com

වෙබ් අඩවිය : www.sandslanka.com

03-124

---

**ඩීඑෆ්සීසී වර්ධන බැංකුව පී එල් සී**
(කලින් සී/ස ඩී එෆ් සී සී වර්ධන බැංකුව ලෙස හැඳින්වූ)

1990 අංක 04 දරන බැංකු විසින් ප්‍රදානය කරන ලද ණය ආපසු අය කර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතෙහි 8 වැනි වගන්තිය යටතේ වටිනා දේපළක් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

**අංක 1470 දරන උකස්කරය යටතේ උකස් කරන ලද දේපළ පිළිබඳ විස්තරය**

මධ්‍යම පළාතේ, මාතලේ දිස්ත්‍රික්කයේ, වගපනහ පල්ලේසියපත්තුවේ, ඉබ්බන්කටුව පිහිටි, නයිගලවත්ත (බලයලත් මිනින්දෝරු ජී. එස්. ගලගෙදර විසින් සාදන ලද අංක 465 දරන පිඹුරේ ලොට් අංක 1සී සහ 2ඒ යන ඉඩම්වල කොටස්) ලෙස හැඳින්වෙන ඩබ්. ඒ. එම්. ඩී. විජේසිංහ (ලියාපදිංචි බලයලත් මිනින්දෝරු) විසින් සාදන ලද 2009 දෙසැම්බර් මස 24 වැනි දිනැති අංක 239/2010 දරන පිඹුරේ ලොට් අංක 37 ලෙස දැක්වෙන සීමා නිර්ණය කර බෙදා වෙන් කරන ලද බිම් කට්ටිය. ඉඩමේ ප්‍රමාණය : අක්. 0 රූ. 0 පර්. 20 එහි පිහිටි ගස්වැල්, වගාවන්, ගොඩනැගිලි සහ සියල්ල සහිතව

මධ්‍යම පළාතේ, මාතලේ දිස්ත්‍රික්කයේ, වගපනහ පල්ලේසියපත්තුවේ, ඉබ්බන්කටුව පිහිටි, නයිගලවත්ත (බලයලත් මිනින්දෝරු ජී. එස්. ගලගෙදර විසින් සාදන ලද අංක 465 දරන පිඹුරේ ලොට් අංක 1සී සහ 2 ඒ යන ඉඩම්වල කොටස්) ලෙස හැඳින්වෙන ඩබ්. ඒ. එම්. ඩී. විජේසිංහ (ලියාපදිංචි බලයලත් මිනින්දෝරු) විසින් සාදන ලද 2009 දෙසැම්බර් මස 24 වැනි දිනැති අංක 239/2010 දරන පිඹුරේ ලොට් අංක 38 ලෙස දැක්වෙන සීමා නිර්ණය කර බෙදා වෙන් කරන ලද බිම් කට්ටිය.

ඉඩමේ ප්‍රමාණය : අක්. 0 රූ. 0 පර්. 20
එහි පිහිටි ගස්වැල්, වගාවන්, ගොඩනැගිලි සහ සියල්ල සහිත.

දඹුල්ල නාඋල ප්‍රසිද්ධ නොතාරිස් අයි. ජී. මුණසිංහ විසින් 2010 ඔක්තෝබර් මස 18 වැනි දිනැති අංක 9474 දරන ඔප්පුව මගින් සාධරණව අයිතිව තිබූ දේපළ.

දඹුල්ල ප්‍රසිද්ධ නොතාරිස් ඩබ්. එන්. කේ. හීන්කෙන්ද විසින් සහතික කරන ලද 2011 ජූලි මස 18 දිනැති අංක 1470 දරන උකස්කරය ප්‍රකාර, දඹුල්ල කුරුණෑගල හන්දිය අංක 443 යන ස්ථානයේ පදිංචි කඹුරුවල ආරච්චිගේ සුසිල් විසින් ඩී එෆ් සී සී වර්ධන බැංකුව පීඑල්සී (කලින් සී/ස ඩීඑෆ්සීසී වර්ධන බැංකුව)ට උකස් කරන ලදුව, ගෙවීම්වල දී පොරොන්දු නිසියාකාරව ඉෂ්ට නොකරන ලද දේපළ.

ඩී එෆ් සී සී වර්ධන බැංකුව පීඑල්සී විසින් අප වෙත පවරන ලද බලය යටතේ අප විසින් 2015 මාර්තු මස 26 වැනි දින (බ්‍රහස්පතින්දා) පෙ. ව. 11.00 ට පිහිටි ස්ථානයේ දී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

*ගෙවීමේ ක්‍රමය.* - මිළ තීන්දු වූ වහාම සාර්ථක ගැණුම්කරු විසින් පහත සඳහන් මුළු මුදල් මුදලින් ගෙවිය යුතු ය.

1. ගැණුම් මිලෙන් 10%ක් (සියයට දහයක්),
2. පළාත් අධිකාරියට ගෙවිය යුතු 1% ක (සියයට එකක) විකුණුම් බදු,
3. වෙන්දේසිකරුගේ කොමිස් මුදල ගැණුම් මිලෙන් 2 1/2% (සියයට දෙකහමාර),
4. රු. 75,000 ක් වන සම්පූර්ණ ප්‍රචාරක පිරිවැය,
5. ලිපිකරුගේ හා සෝෂකගේ ගාස්තුව රු. 500,
6. විකුණුම් කොන්දේසි සඳහා නොතාරිස් ගාස්තුව රු. 2,000.

ගැණුම් මිලෙන් 90% ක් වූ ඉතිරිය ද ශ්‍රී ලංකා ආණ්ඩුව විසින් හෝ වෙනත් අධිකාරියක් විසින් හෝ පනවනු ලබන වෙනත් ව්‍යවස්ථාපිත බදු, තීරු බදු, අය බදු හෝ ගාස්තු අය කිරීම් ද වෙතොත් ඒවා ද සමග වෙන්දේසි දින සිට දින 30 ක් ඇතුළත ගෙවිය යුතු වේ.

වැඩි විස්තර සඳහා කරුණාකර ඩී එෆ් සී සී වර්ධන බැංකුවේ නීති දෙපාර්තමේන්තුව අමතන්න. දුරකථන අංක 011- 2442442.

"ඉහත වෙන්දේසිය පෙර දැනුම්දීමකින් තොරව නවතා ගැනීමේ/ අවලංගු කිරීමේ පූර්ණ අයිතිය බැංකුව සතු ය".

ෂොක්මන් සහ සමරවික්‍රම,
වෙන්දේසිකරුවෝ.

*ප්‍රධාන කාර්යාලය :*
අංක 24, ටොරින්ටන් පාර,
මහනුවර.
දුරකථන අංකය : 081 - 2227593
දුරකථන/ෆැක්ස් අංකය : 081-2224371
ඊමේල් : schokmankandy@sltnet.lk

*නගර කාර්යාලය හා ප්‍රදර්ශනාගාරය :*
අංක 290, හැව්ලොක් පාර,
කොළඹ 05
දුරකථන අංක : 011-2502680, 2585408
දුරකථන/ෆැක්ස් අංකය : 011- 2588176
ඊමේල් : schokman@samera1892.com

වෙබ් අඩවිය : www.sandslanka.com

03-125

---

**සම්පත් බැංකුව පීඑල්සී**
(සීමාසහිත සම්පත් බැංකුව නමින් කලින් හැඳින්වූ)

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 09 වැනි වගන්තිය යටතේ කරනු ලබන විකුණුම් නිවේදනය

ඇන්තන් ට්‍රේඩින් කම්පැණි (ප්‍රයිවට්) ලිමිටඩ්.
ගිණුම් අංක : 0009 1000 5669.

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 09 වැනි වගන්තිය යටතේ ලැබී ඇති බලතල ප්‍රකාර 2013.01.24 වැනි දින සම්පත් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කර ගන්නා ලද යෝජනා සම්මුතියට අනුව රුපියල් පන්කෝටි තිස්එක් ලක්ෂ පනස් තුන් දහස් තුන්සිය පනස් පහයි ශත පනස් හතරක (රු. 53,153,355.54) මුදල ද, 2012 නොවැම්බර් මස 08 වැනි දින සිට අයවිය යුතු මුළු මුදල පියවනු ලබන දිනය තෙක්, රුපියල් හාරකෝටි අනූ නම ලක්ෂ අනූනම දහස් නමසිය හතලිස් දෙකයි ශත හැට තුනක (රු. 49,999,942.63) මුදලක් සඳහා වාර්ෂිකව සියයට දහ හතක් (17%) බැගින් වූ පොළිය ද, දැන්වීම් ගාස්තු ද, ප්‍රචාරණ වියදම් ද, දරන්නට සිදු වූ වෙනත් ගාස්තු ද තදනන්තරව දරන්නට සිදු වූ යම් මුදලක් වෙතොත් ඒවා අඩු කොට අයකර ගැනීම සඳහා මෙහි උපලේඛනයේ සඳහන් දේපළ සහ පරිශ්‍රයන් 2013.03.01 වැනි දින *රජයේ ගැසට් පත්‍රයේ* 2013.02.18 වැනි දින "දිවයින" සහ "තිනකුරල්" සහ "අයිලන්ඩ්" දිනපතා ප්‍රවෘත්තිපත්‍රවල පළකොට ඇති පරිදි 2015.03.25 වැනි දින පෙ. ව. 10.30 ට පිහිටි ස්ථානයේ දී කොළඹ බලයලත් වෙන්දේසිකරුවන් වන පී. කේ. ඊ. සේනාපති යන අය විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

*උපලේඛනය*

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, මහ නගර සභා සීමාවන් තුළ දකුණු කොච්චිකඩේ වෝඩ් අංක 19 පිහිටි පරණ යෝන් වීදිය වරිපනම් අංක 193 (කොටසක්) දරන බලයලත් මානක තැන එස්. එච්. බී. ජෝශප් යන අය විසින් සාදන ලද 1984 දෙසැම්බර් මස 11 දාතම හා අංක 62/84 දරන පිඹුරේ නිරූපිත ඉඩම් කොටසේ උප බෙදුමක් සහ නැවත මිනුමක් වන ඉඩමට බලයලත් මානක තැන පී. සින්නතම්බි යන අය විසින් සාදන ලද 1994 නොවැම්බර් මස 07 දාතම හා අංක 4746 දරන පිඹුරේ නිරූපිත සීමා නිර්ණය කොට බෙදාවෙන් කොට ලොට් "එක්ස්" වශයෙන් ලකුණුකොට ඇති ඉඩම් කොටසට මායිම්, උතුරට : අලුත් යොන් වීදිය වරිපනම් අංක 216 දරන පරිශ්‍රයන්, නැගෙනහිරට : මෙහි ලොට් "වයි" දකුණට : පරණ යොන් වීදිය සහ බස්නාහිරට : පරණ යොන් වීදිය වරිපනම් අංක 189 දරන පරිශ්‍රයන් යන මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් පර්චස් නමයයි දශම පහයි හයක් (අ. 0 රූ. 0 පර්. 9.56) විශාල ඉඩම් කොටස සමග පස, ගහකොළ, වගාවන් ගොඩනැගිලි සහ එහි පිහිටි සෑම සියලු දේ සහ සියළුම මාර්ග අයිතීන් ද, වෙනත් අයිතීන් ද, වරප්‍රසාදයන් ප්‍රවශතාවයන්, පරවශ්‍යතාවයන් සහ ඒ හා සම්බන්ධ අනුබද්ධයන් ද සමග එකී අංක 4746 දරන පිඹුරට අනුව වෙළුම/පත්ඉරුව ඒ 1116/228 යටතේ කොළඹ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි කොට ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

සමාගම් ලේකම්.

03-167

## ලංකා බැංකුව

### 1968 අංක 34 දරන පනතින් හා 1974 අංක 10 දරන නීතියෙන් සංශෝධනය කරන ලද ලංකා බැංකු ආඥාපනතේ (397 අධිකාරය) 22 වගන්තිය යටතේ විකිණීම පිළිබඳ දැන්වීම

ණය යොමු අංකය : 73305072
අහමඩ් ජමීල්ඩීන් මරික්කාර් මොහොමඩ් අබූයූසුෆ්
ෆාතිමා අස්වියා යූසුෆ් හෙවත් ෆරීඩ්
මොහොමඩ් අම්ෂාර් අන්සාෆ් යූසුෆ් යන අයට අයත් උකස් කරන ලද දේපළ විකිණීම

ලංකා බැංකු ආඥාපනතේ 19 වැනි වගන්තිය යටතේ සම්මත කරනු ලැබ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ 2014.09.26 දිනැති අංක 1882 දරන ගැසට් පත්‍රයේ හා 2014 සැප්තැම්බර් මස 11 වැනි දින බ්‍රහස්පතින්දා දින "ඩේලිනිව්ස්", "දිනමිණ" හා "තිනකරන්" යන පුවත්පත් වල පළකරන ලද ලංකා බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලයේ යෝජනා සම්මුතියකට අනුකූලව මුල් ණය මුදලේ ශේෂය ද, විකිණීම කෙරෙන දිනය තෙක් ඒ මත අයවිය යුතු පොළිය ද, ලංකා බැංකු ආඥාපනතේ අංක 26 වැනි වගන්තිය යටතේ අයකර ගත හැකි ගාස්තු හා මුදල් ද අයකර ගැනීම පිණිස මෙහි පහත උපලේඛනයේ විස්තර කොට ඇති දේපළ සහ පරිශ්‍ර එකී ස්ථානයේ දී ම 2015.04.04 වැනි දින පෙ. ව. 11.30 ට කොළොන්නාව, විහාර මාවතේ, අංක 182/3 හි පදිංචි ටී ඇන්ඩ් එච් ඔක්ෂන්ස් හි වෙන්දේසිකාර තුසිත කරුණාරත්න මහතා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බව මෙයින් දන්වා සිටිමු.

## උපලේඛනය

වයඹ පළාතේ, පුත්තලම් දිස්ත්‍රික්කයේ, පුත්තලම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ සහ මදුරන්කුලිය ග්‍රාම නිලධාරී කොට්ඨාසයේ, මුන්දලම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, පුත්තලම ප්‍රාදේශීය සභා සීමාවේ, මදුරන්කුලිය ග්‍රාමයේ, කොළඹ පාරේ, පිහිටි "මදුරන්කුලි තෝට්ටම් නොහොත් චන්ඩිචේනෙයි" නමැති ඉඩමට එහි ඇති ගොඩනැගිලි, ගහකොළ සහ වෙනත් සියලු දේ ද ඇතුළත්ව බලයලත් මිනින්දෝරු වී. විග්නේශ්වරන් විසින් සාදන ලද 2012 ජනවාරි 12 දිනැති අංක 6175 දරන පිඹුරෙහි ලොට් 1 ලෙස දක්වා සීමා නිර්ණය කොට නිරූපණය කර ඇති බෙදූ ඉඩම් කැබැල්ල එනම් එකී ලොට් 1 උතුරට : ලංකා බැංකු මදුරන්කුලිය ශාඛාවේ ඉඩම සහ පරිශ්‍රය ද, නැගෙනහිරට : පාර (අඩි 12 පළල) ද, දකුණට : එස්. එච්. එම්. උම්මා සහ සිද්දීක්ට අයත් ඉඩම ද, බස්නාහිරට : හලාවත පුත්තලම් පාර ද, මායිම්ව එකී අංක 6175 දරන පිඹුරට අනුව පර්චස් තිස් අටයි දශම හයයි පහක (අ. 0 රූ. 0 පර්. 38.65) බිම් ප්‍රමාණයකින් යුක්ත වන අතර මෙය පුත්තලම ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ පී 119/77 හි ලියාපදිංචි කර ඇත.

ලංකා බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

එම්. එස්. එම්. පී. ගුණතිලක මහත්මිය,
ජ්‍යෙෂ්ඨ කළමනාකාරිණී.

ලංකා බැංකුව,
දෙහිවල.

03-172

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## දැන්වීම් සහ ප්‍රකාශනයන් සඳහා අය කරනු ලබන

## සංශෝධිත ගාස්තු

2013 ජනවාරි මස 01 වැනි දින සිට

(සෑම සිකුරාදා දිනයන්හි ගැසට් පත්‍රය පළ කරනු ලැබේ.)

*සියළුම ගැසට් පත්‍ර නියමිත දිනට www. documents.gov. lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

1. සියලු ම දැන්වීම් සහ ප්‍රකාශනයන් පළ කරනු ලබන්නේ ප්‍රසිද්ධ කරන්නාගේ වගකීම පිටය.
2. පෞද්ගලික පළකරන්නන්ගේ සියලු ම දැන්වීම් සහ ප්‍රකාශන ඒ සඳහා නියමිත සම්පූර්ණ ගාස්තුවත් සමග කොළඹ 08, බොරැල්ල, ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණාලයාධිපතිට තැපෑලෙන් එවීමට හෝ ගෙනැවිත් භාරදීමට පුළුවන.
3. කාර්යාල වේලාවන් පෙරවරු 8.30 සිට පස්වරු 4.15 දක්වා වේ.
4. මුදල් ගනුදෙනු කරනු ලබන්නේ පෙරවරු 9.00 සිට පස්වරු 3.00 දක්වා බව සැලකිය යුතු යි.
5. සියලු ම දැන්වීම් සහ ප්‍රකාශන සඳහා ගාස්තුව කලින් ගෙවිය යුතුයි. දැන්වීම් සහ ප්‍රකාශනයන් තැපෑලෙන් එවන විට ඒ සමග ම අයවිය යුතු ගාස්තුව සඳහා මුදල් ඇනවුමක් හෝ චෙක් පතක් හෝ තැපැල් ඇනවුමක් රජයේ මුද්‍රණාලයාධිපතිට එවිය යුතු ය. මුදල් ඇණවුම් ගෙවන කාර්යාලය බොරැල්ල තැපැල් කාර්යාලය වේ.
6. ප්‍රමාදය සහ දොස් වළක්වා ගැනීම සඳහා පළ කරන්නට නියමිත පිටපත කඩදාසියේ එක් පැත්තක පමණක් පැහැදිලි ව ටයිප් කර එවිය යුතු ය. **අත් අකුරින් ලියූ කිසිම නිවේදනයක් භාරගනු නොලැබේ.**
7. සෑම අත්සනකට ම යටින් අකුරු වෙන්කොට පැහැදිලිව අත්සනේ අකුරු ලිවිය යුතු යි.
8. වෙළෙඳ ප්‍රචාරක කටයුතු සඳහා දැන්වීම් හා රජයේ සේවයේ නොවන අයගේ නම් වෙනස් කිරීම පිළිබඳ කරන දැන්වීම් පළ කරනු නොලැබේ.
9. උසාවියේ අණපනත් යටතේ නිකුත් කළා යැයි හැඟෙන ප්‍රකාශන, සුප්‍රීම් උසාවියේ නීතිඥවරයකුගේ අනුමැතිය හෝ අත්සන නොමැතිව ප්‍රසිද්ධ කරනු නොලැබේ.
10. **2013 ජනවාරි මස 01 වැනි දින සිට දැන්වීම් සහ ප්‍රකාශනයන් සඳහා අය කරන ගාස්තු මෙසේ යි :-**

| | රු. ශ. |
|---|---|
| අඟලකට හෝ ඉන් අඩුව ... ... ... ... | 137 0 |
| වැඩිවන සෑම අඟලකට හෝ ඉන් කොටසකට ... ... ... | 137 0 |
| තනි තීරුවකට හෝ ගැසට් පිටුවකින් අඩකට ... ... ... | 1,300 0 |
| තීරු දෙකකට හෝ සම්පූර්ණ ගැසට් පිටුවකට ... ... ... | 2,600 0 |

*(අඟලේ සෑම කොටසකට ම සම්පූර්ණ අඟලකට අය කරනු ලබන ගාස්තුව අය කරනු ලැබේ.)*

11. සෑම සිකුරාදා දිනකට ම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රය* පළ කරනු ලැබේ. ප්‍රසිද්ධ නිවාඩු දින අතරට පැමිණෙන සෑම සතියක දී ම පළ කරන දිනය වෙනස් වීමට ඉඩ තිබේ.
12. සෑම මාසයක ම මුල් සතියේ *ගැසට් පත්‍රයේ* සෑම කොටසක ම කෙලවරෙහි වෙනම පළවන දැන්වීමේ සඳහන් ප්‍රකාර, සියලු ම දැන්වීම් සහ ප්‍රකාශනයන් කොළඹ 08, රජයේ මුද්‍රණාලයේ මුද්‍රණාලයාධිපතිට ලැබෙන සේ එවිය යුතු යි.
13. *ගැසට් පත්‍රය* නොලැබීම, ප්‍රමාද වී ලැබීම සහ ලිපිනය වෙනස් කිරීම් ආදිය කොළඹ 08, රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ, මුද්‍රණාලයාධිපතිට දැනුම් දිය යුතු ය.
14. **2013 ජනවාරි මස 01 වැනි දින සිට ක්‍රියාත්මකවන සංශෝධිත දායක ගාස්තුව :-**

### ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය - (වාර්ෂික දායක මුදල සහ තැපැල් ගාස්තුව)

| | වාර්ෂික දායක මුදල රු. ශ. | තැපැල් ගාස්තුව රු. ශ. |
|---|---|---|
| I වැනි කොටස : | | |
| I වැනි ඡේදය ... ... ... ... ... ... ... | 4,160 00 | 9,340 00 |
| II වැනි ඡේදය (පළ කිරීම්, ඇබෑර්තු, ටෙන්ඩර් සහ විභාග ආදිය) ... ... | 580 00 | 950 00 |
| III වැනි ඡේදය (වෙළඳ ලකුණු හා පේටන්ට් බලපත්‍ර ආදිය ) ... ... | 405 00 | 750 00 |
| I වැනි කොටස සම්පූර්ණයෙන් (I, II සහ III ඡේද තුන ම ඇතුළත් ව ) ... ... | 890 00 | 2,500 00 |
| II වැනි කොටස (අධිකරණ) ... ... ... ... ... ... ... ... | 860 00 | 450 00 |
| III වැනි කොටස (ඉඩම්) ... ... ... ... ... ... ... ... | 260 00 | 275 00 |
| IV වැනි කොටස (පළාත් පාලන දැන්වීම් සහ පළාත් සභා දැන්වීම්) ... | 2,080 00 | 4,360 00 |
| V වැනි කොටස (මඟීන් ගෙන යෑමේ අවසර සහ පොත් නාමාවලිය) | 1,300 00 | 3,640 00 |
| VI වැනි කොටස (ජූරිසභිකයින්ගේ හා උපදේශකවරුන්ගේ නාමාවලිය)... ... | 780 00 | 1,250 00 |
| අති විශෙෂ ගැසට් පත්‍රය... ... ... ... ... ... ... ... | 5,145 00 | 5,520 00 |

(ලිත් වර්ෂය අවසානයේ නිමවන සේ දායක ගාස්තු භාරගනුයේ දොලොස් මාසයකට නොඅඩු කාලසීමාවකට පමණ ය. )

### * තනි පිටපත් සඳහා ගාස්තු (පිටපත් විකිණීමට තිබේ නම්)

| | පිටපතක මිල රු. ශ. | තැපැල් ගාස්තුව රු. ශ. |
|---|---|---|
| I වැනි කොටස : | | |
| I වැනි ඡේදය ... ... ... ... ... ... ... ... | 40 00 | 60 00 |
| II වැනි ඡේදය (පළ කිරීම්, ඇබෑර්තු, ටෙන්ඩර් සහ විභාග ආදිය) ... ... | 25 00 | 60 00 |
| III වැනි ඡේදය ... ... ... ... ... ... ... ... | 15 00 | 60 00 |
| I වැනි කොටස සම්පූර්ණයෙන් (I, II සහ III ඡේද තුන ම ඇතුළත් ව) ... ... | 80 00 | 120 00 |
| II වැනි කොටස ... ... ... ... ... ... ... ... ... | 12 00 | 60 00 |
| III වැනි කොටස ... ... ... ... ... ... ... ... ... | 12 00 | 60 00 |
| IV වැනි කොටස (පළාත් පාලන දැන්වීම් සහ පළාත් සභා දැන්වීම්) ... ... ... | 23 00 | 60 00 |
| V වැනි කොටස ... ... ... ... ... ... ... ... ... | 123 00 | 60 00 |
| VI වැනි කොටස ... ... ... ... ... ... ... ... ... | 87 00 | 60 00 |

* කොළඹ 05, පොල්හේන්ගොඩ, කිරුළපන මාවතේ, අංක 163 හි පිහිටි රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් තනි පිටපත් මිල දී ගත හැක.

# ගැසට් පත්‍රය පළ කිරීම පිළිබඳව වැදගත් නිවේදනයයි

සතිපතා මුද්‍රණය වන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රය* සාමාන්‍යයෙන් සිකුරාදා දිනවල පළ කරනු ලැබේ. සිකුරාදා දිනයක් රජයේ නිවාඩු දිනයක් වූ විට එම සිකුරාදා දිනට ප්‍රථම වැඩ කරන දිනයේ *ගැසට් පත්‍රය* පළ කරනු ලැබේ. ඒ අනුව *ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා නිවේදන භාරගන්නා අන්තිම දිනය ද එම සතියේ ඇතිවන නිවාඩු දින ගණන අනුව වෙනස් වනු ඇත.

ඒ ඒ *ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාර ගන්නා අන්තිම දිනය සහ වේලාවන් පහත පළ කර ඇති උපලේඛනයේ දක්වේ. පහත සඳහන් නියමිත වේලාවට පසු ලැබෙන සියලුම දැන්වීම් එය එවූ අය වෙත තැපෑලෙන් ආපසු එවනු ලැබේ. ඊළඟ *ගැසට් පත්‍රයේ* එය පළ කළ යුතු නම් අවශ්‍ය සංශෝධනයන් කර ආපසු එවිය යුතුය. රජයේ මුද්‍රණාලය වෙත තැපැල් මගින් එවන දැන්වීම් අප්‍රමාදව එහි ලැබීමට සෑහෙන වේලාවක් දී තැපැල් කිරීමෙන් වුවමනා *ගැසට් පත්‍රයට* දැන්වීම ඇතුළත් වෙනවා මෙන් ම එය සියලු දෙනාගේ ම පහසුවට ද හේතු වන බව සළකන්න.

**ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රය* මිල දී ගැනීම සඳහා සියලුම දායක මුදල් රජයේ මුද්‍රණාලයාධිපති වෙත කෙළින් ම ගෙවිය යුතුය.**

***සැළකිය යුතුයි.*** - මුදල් ගෙවා *ගැසට් පත්‍රයේ* පළ කරනු ලබන දැන්වීම් සඳහා අයවිය යුතු මුදල් රජයේ මුද්‍රණාලයාධිපති වෙත එවිය යුතු බව සළකන්න.

## උපලේඛනය

| *මාසය* | *පළ කිරීමේ දිනය* | | *ගැසට් පත්‍රයේ පළ කිරීම සඳහා දැන්වීම් භාර ගන්නා අන්තිම දිනය හා වේලාව* | | | |
|---|---|---|---|---|---|---|
| | | | **2015** | | | |
| මාර්තු | 2015.03.06 | සිකුරාදා | 2015.02.20 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2015.03.13 | සිකුරාදා | 2015.02.27 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2015.03.20 | සිකුරාදා | 2015.03.06 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2015.03.27 | සිකුරාදා | 2015.03.13 | සිකුරාදා | දහවල් | 12.00 |
| අප්‍රේල් | 2015.04.02 | බ්‍රහස්පතින්දා | 2015.03.20 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2015.04.10 | සිකුරාදා | 2015.03.27 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2015.04.17 | සිකුරාදා | 2015.04.02 | බ්‍රහස්පතින්දා | දහවල් | 12.00 |
| | 2015.04.24 | සිකුරාදා | 2015.04.10 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2015.04.30 | බ්‍රහස්පතින්දා | 2015.04.17 | සිකුරාදා | දහවල් | 12.00 |
| මැයි | 2015.05.08 | සිකුරාදා | 2015.04.24 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2015.05.15 | සිකුරාදා | 2015.04.30 | බ්‍රහස්පතින්දා | දහවල් | 12.00 |
| | 2015.05.22 | සිකුරාදා | 2015.05.08 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2015.05.29 | සිකුරාදා | 2015.05.15 | සිකුරාදා | දහවල් | 12.00 |

**ඩබ්ලිව්. ඒ. ඒ. ජී. ෆොන්සේකා,**
රජයේ මුද්‍රණාලයාධිපති. *(වැ. බ.)*

2015 ජනවාරි මස 22 වැනි දින,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව,
කොළඹ 08.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.